**ශීර්ෂය 193 - කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 193 - කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූනි 22 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 260.75 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 237.07 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 23.68 ක් හෙවත් සියයට 9.09 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 215.56 | 202.63 | 12.93 | 6.00 |
| මූලධන | 45.19 | 34.44 | 10.75 | 23.79 |
| **එකතුව** | **260.75** | **237.07** | **23.68** | **9.09** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 19301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 2.00 | 1.26 | 0.20 | 0.63 | 35.00 | 15.36 |

**2.3 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශය යටතේ 2015 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.12,593 ක් වූ අතර එය 2016 පෙබරවාරි 01 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

**2.4 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 4 ක 2015 දෙසැම්බර් 31 දිනට බැර ශේෂ එකතුව රු.මිලියන 19.36 ක් වී තිබුණු අතර හර ශේෂය රු. මිලියන 4.99 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0012/0080/000 | (4.99) |
| 6000/0000/00/0016/0095/000 | 0.11 |
| 6000/0000/00/0017/0026/000 | 19.24 |
| 6000/0000/00/0018/0098/000 | 0.01 |
| **එකතුව** | **14.37** |

**2.5 විගණන නිරීක්ෂණය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
|---|---|---|
| (i) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය . |
| (ii) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1). |

**3.2 විසර්ජන ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 3 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 1 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 76 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි .

**3.3 පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවාදායකයන් විසින් ආපදාවලට ලක්වූවන් වෙත ගෙවීම සඳහා වන්දි කොමසාරිස් කාර්යාලය වෙත ලබාදී තිබුණු රු.මිලියන 19 ක් වර්ෂ 5 ක පමණ කාලයක සිට පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ආ) අධිකරණ අමාත්‍යාංශය සඳහා සලසා දෙන ලද ප්‍රතිපාදන මත කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය නව අමාත්‍යාංශයක් ලෙස ස්ථාපිත කර තිබුණි. සමාලෝචිත වර්ෂය ආරම්භයේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ වියදම් කිරීම සඳහා 2015 අප්‍රේල් 21 දින අවිනිශ්චිත අවස්ථා අරමුදලින් රු.මිලියන 5 ක අත්තිකාරම් ලබා දී තිබුණි. එම අත්තිකාරම් මුදල් රෙගුලාසි 487 ප්‍රකාරව අමාත්‍යාංශය විසින් ගිණුම්ගත කර නොතිබුණි. නමුත් එම කාල පරිච්ඡේදය තුළ අමාත්‍යාංශය විසින් කර තිබුණු වියදම මුදල් රෙගුලාසි 206 විධිවිධානවලට පටහැනිව තැන්පත් ගිණුමට බැර කර තිබුණි. ඒ නිසා 2015 දෙසැම්බර් 31 දින වන විට තැන්පත් ගිණුමේ රු.මිලියන 4.99 ක හර ශේෂයක් පැවැතුණි. .

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 19301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී ස්ථාන මාරු වී ගිය, මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් වර්ෂ 2ක සිට වර්ෂ 3ක් දක්වා කාල පරාසයක සිට පැවත එන රු.177,274 ක් වූ හිඟ හිටි ණය ශේෂය ද, සේවය හැර ගිය නිලධාරීන්ගෙන් වර්ෂ 3 ක සිට වර්ෂ 4 ක් දක්වා කාල

පරාසයක සිට පැවත එන රු.138,501 ක හිඟ හිටි ණය ශේෂය ද, 2015 දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශයේ වාහන පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ii) 2015 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් ඉහත චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශය විසින් අධිකරණ අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණු වාහන දෙකක් 2015 වර්ෂය අවසානය වන විටත් නැවත කම්කරු අමාත්‍යාංශය වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.6 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරික්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි138 | 1,387,556 | ගෙවීම් වවුචර් 56 ක් සහතික කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි137 | 151,880 | වාහන අළුත්වැඩියාවෙන් පසු එම අළුත් වැඩියාව නිවැරදිව සිදු කල බවට ඉංජිනේරු සහතිකයක් ලබාගෙන නොතිබුණි . |

| | | |
|---|---|---|
| (iii) මුදල් රෙගුලාසි 1646 | - | අමාත්‍යාංශයේ සංචිත වාහන සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන් හා ගමන් පිළිබඳ මාසික සාරාංශ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි |

**(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

**--------------------------**

| | | |
|---|---|---|
| 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛයේ 4 වන ඡේදය | - | වෙන්කළ වාහනය සඳහා ඉන්ධන දීමනාව ගෙවා තිබුණත්, කම්කරු වන්දි කොමසාරිස්වරිය වන්දි කොමසාරිස් කාර්යාලයෙන් බැහැරව ඉටුකර තිබුණු රාජකාරි සඳහා සැතපුම් කුලිය ලබාගෙන තිබුණි. |

**(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

**-----------------------------------**

| | | |
|---|---|---|
| 2.8(අ) , 5.6.1(ආ) මාර්ගෝපදේශය | - | විධිමත් පිරිවිතර හා තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතියකින් තොරව පරිගණක යන්ත්‍ර 2ක් මිලදී ගෙන තිබුණි. |

**3.7 කාර්යසාධනය**

**---------------**

2015 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) **ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

**-------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ ප්‍රමාණවත් පරිදි ඉටු නොකළ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

(i) අමාත්‍යාංශයේ ඵලදායීතාවය වර්ධනය කිරීම සඳහා කොටස් 4 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කළ කාර්යයන්වලින් සියයට 20 ක සිට සියයට 45 ක් දක්වා පරාසයක ප්‍රමාණයන්ගෙන් එම කාර්යයන් ඉටු කර තිබුණි.

(ii) විද්‍යුත් රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම යටතේ සැලැසුම් කළ කාර්යයන් 6 න් වර්ෂය අවසානය වන විට එම ඉලක්කයන්ගෙන් සියයට 20 ක ප්‍රමාණයක් සපුරාගෙන තිබුණු අතර එක් වැඩසටහනක් පමණක් සියයට 70 ක ඉලක්ක ඉටුකරගෙන තිබුණි.

(iv) පර්යේෂණ, සමීක්ෂණ හා ප්‍රකාශන යටතේ සැලැසුම් කිරීමේ කාර්යයන්ගෙන් කම්කරු නීතිය වටහා ගැනීම සඳහා වූ ප්‍රකාශනය පිළියෙල කිරීම සියයට 55ක් පමණක් ඉටුකරගෙන තිබුණි.

(v) කම්කරු හා විදේශීය සම්බන්ධතා යටතේ සැලැසුම් කළ කාර්යයන් 4 න් 2 ක් සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කර නොතිබූ අතර විෂයන් 2 ක් පිළිවෙලින් සියයට 50 ක් හා සියයට 70 ක් වශයෙන් ඉටුකරගෙන තිබුණි.

## 3.8 පාඩු හා හානි

----------------

2013 වර්ෂයේ හදිසි අනතුරකට ලක් වූ අමාත්‍යාංශයට අයත් මෝටර් රථයකට සිදු වූ අලාභහානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එම අලාභහානිය මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

## 3.9 කළමනාකරණ දුර්වලතා

--------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කළමනාකරණ දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ආපදාවකට හෝ මරණයකට පත්වන සේවකයන් වෙනුවෙන් සේවා යෝජකයින්ගෙන් අප්‍රමාදව වන්දි මුදල් අයකර දීම මගින් සේවක තෘප්තිය ඇති කිරීමේ දැක්ම සහිතව කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය ස්ථාපිත කර තිබුණි. නමුත් එම කාර්යාලය විසින් අයකර ගනු ලැබූ රු.55,886,848 ක වන්දි මුදල් හිමිකරුවන් වෙත ලබා දීමට දින 14 ක සිට දින 1,634 ක් අතර කාල පරාසයක ප්‍රමාදයන් සිදු කර තිබුණි.

(ආ) 2015 සැප්තැම්බර් 31 දින වන විට සේවායෝජකයින් විසින් අදාළ ප්‍රතිලාභීන්ට වන්දි ලබා දීම සඳහා මුදල් තැන්පත් කර තිබුණි. එදින වන විට සේවායෝජකයන්ගෙන් මාස 3 ක සිට වර්ෂ 6 ක් දක්වා කාල පරාසයක සිට ලැබී තිබුණු රු. 15,192,313 ක වන්දි මුදල් අදාළ ප්‍රතිලාභීන් වෙත ලබා දී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ වයස් සම්පූර්ණත්වයට පත්ව තිබුණු ප්‍රතිලාභීන් 531 ට අදාළ වූ රු.24,071,183 ක් වූ ඉතිරි කිරීමේ පාස් පොත් වන්දි කොමසාරිස් කාර්යාලය සතුව පැවති අතර, එම මුදල් නිදහස් කිරීමේ ප්‍රමාද කාලය වර්ෂ 1 ක සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයකට අදාළ විය.

(ඈ) අනතුරට ලක් වූ වර්ෂ 12 කට වඩා පැරණි අමාත්‍යාංශයට අයත් මෝටර් රථයක් අළුත්වැඩියා කිරීමට විශාල පිරිවැයක් දැරීමට සිදුවන බැවින් රක්ෂණ ආයතනයෙන් ලබා දීමට එකඟ වී තිබුණු රු 1,200,000.ක රක්ෂණ වන්දිය ලබා ගැනීම සඳහා 2015 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඉ) රාජ්‍ය - පුද්ගලික සමාගමක් ලෙස ක්‍රියාත්මක වූ "රැකියා පියස" මගින් ඉටුකරන ලද කාර්යන් රැකිරක්ෂා හා මිනිස්බල දෙපාර්තමේන්තුව මගින් ඉටුකරගනු ලබන නමුත් "රැකියා පියස" ඇවර කර ගිණුම් පියවා දැමීමට 2015 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.10 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 12 | 02 |
| (ii) | ද්විතියික මට්ටම | 71 | 54 | 17 |
| (iii) | තෘතියික මට්ටම | 05 | 04 | 01 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 31 | 26 | 05 |
| | **එකතුව** | **121** | **96** | **25** |

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට මුදාහැර තිබුණු සේවකයන් 5 දෙනෙකු සඳහා රු. 2,310,339 ක් වැය කර තිබුණි.